# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර
# Bhiksu University of Sri Lanka - Anuradhapura

**2017/2018 අධ්‍යයන වර්ෂය - සමාසික 1 පරීක්ෂණය**
**ප්‍රථම වසර**
**2017/2018 Academic Year - Semester 1 Examination**
**First Year**

## අධ්‍යාපනයේ මූලිකාංග – EDSG 11013

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න. කාලය පැය 02 යි.

---

01.

I. අවිධිමත් අධ්‍යාපනය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03)

II. නොවිධිමත් අධ්‍යාපනයේ අවශ්‍යතාව පැහැදිලි කරන්න. (ලකුණු 07)

III. ''අධ්‍යාපනය යනු අත්දැකීම් ලබා දීමේ හා ලබා ගැනීමේ ක්‍රියාවලියයි'' විමර්ශනය කරන්න. (ලකුණු 10)

02.

I. 'ඉගෙනීම' යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03)

II. 'ඉගැන්වීම' විස්තර කරන්න. (ලකුණු 07)

III. යාවජීව අධ්‍යාපනයේ උපයෝගිතාව විස්තර කරන්න. (ලකුණු 10)

03.

I. ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන පරමාර්ථය ලියා දක්වන්න. (ලකුණු 03)

II. ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන අරමුණු 05 ක් (පහක්) ලියා දක්වන්න. (ලකුණු 07)

III. අධ්‍යාපන පරමාර්ථ හා පොදු අරමුණු සාධනය කර ගැනීමෙහිලා ගුරුවරයාගේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

04.

I. ගුරුවරයා පිළිබඳව ඉදිරිපත් වී ඇති පිළිගත් නිර්වචනයක් ලියා දක්වන්න. (ලකුණු 03)

II. මනා ගුරු පෞරුෂයක් යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 07)

III. ''බුද්ධ චරිතයෙන් විශිෂ්ට ගුරුවරයෙකුගේ ලක්ෂණ විද්‍යමාන වේ.'' විමසන්න. (ලකුණු 10)

05.

I. ශ්‍රී ලංකාවේ වර්තමාන ජාතික අධ්‍යාපන කළමනාකරණ ව්‍යුහය රූප සටහනකින් දක්වන්න. (ලකුණු 03)

II. වර්තමානයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පිරිවෙන් විෂයමාලාව, විස්තර කරන්න. (ලකුණු 07)

III. වර්තමාන ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනයේ පවතින ගැටලු දෙකක් (02) විස්තර කරන්න. (ලකුණු 10)

06. පහත මාතෘකා **<u>04 කට</u>** කෙටි සටහන් ලියන්න.

I. විෂයමාලාව
II. ඉගෙනුම් උපකරණ
III. ඉගෙනුම් න්‍යායන්
IV. අධ්‍යාපනයේ කුළුණු හතර
V. ශිෂ්‍ය විවිධත්වය

(ලකුණු 04 x 05 = 20)